**ශ්‍රී ලංකා ඉදිකිරීම් කර්මාන්ත මණ්ඩලය - 2019**
**-----------------------------------------------**

## 1.1 තත්ත්වාගණනය කළ මතය

**---------------------------**

ශ්‍රී ලංකා ඉදිකිරීම් කර්මාන්ත මණ්ඩලයේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් මාස 09 ක කාල පරිච්ඡේදය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වූ කාල පරිච්ඡේදය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් කාල පරිච්ඡේදය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 2019 අංක 23 දරණ ශ්‍රී ලංකා ඉදිකිරීම් කර්මාන්ත මණ්ඩලයේ ( සංසථාපිත) පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මෙම විගණනය සඳහා ප්‍රසිද්ධ වෘත්තියෙහි යෙදී සිටින වරලත් ගණකාධිකාරී සමාගමක සහය මා ලබා ගන්නා ලදී.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මණ්ඩලයේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් කාලපරිච්ඡේදය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් සුළු හා මධ්‍ය ප්‍රමාණයේ ව්‍යවසායන් සඳහා වන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට (LKAS for SMEs) අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

----------------------------------------------

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

----------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන සුළු හා මධ්‍ය ප්‍රමාණයේ ව්‍යවසායන් සඳහා වන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, මණ්ඩලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය මණ්ඩලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

මණ්ඩලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, මණ්ඩලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

-----------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ මණ්ඩලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ මණ්ඩලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, මණ්ඩලය ක්‍රියා කර ඇති බව,

- මණ්ඩලය සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- මණ්ඩලය සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

### 1.5.1 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) සමාලෝචනයට භාජනය වූ කාල සීමාව තුළ ලැබී තිබූ රු.8,310,195 ක ශ්‍රී ලංකා ගොඩනැගීමේ ප්‍රදර්ශන ආදායම, පෙර වර්ෂයට හා ඉදිරි වර්ෂයට අදාළව පිළිවෙලින් රු.6,420,195 සහ රු. 1,890,000 කින් සමන්විත විය. කෙසේ වෙතත්,මෙම ආදායම් අදාල ගිණුම් වලට නොගෙන මණ්ඩලය විසින් එය මෙම කාල පරිච්ඡේදයට අදාල ආදායමක් ලෙස සලකා තිබුනි. එහි ප්‍රතිඵලයක් ලෙස මෙම කාලපරිච්ඡේදය සඳහා වූ ඌනතාවය රු.8,310,195 කින් අඩුවෙන් දක්වා තිබනි. | මණ්ඩලය සංස්ථාපනය කිරීමට පෙර, බොහෝ ගනුදෙනුකරුවන් සම්පූර්ණ ගෙවීම සිදුකරන තෙක් ඔවුන් ප්‍රදර්ශණ කුටි වෙන් කිරීම පිළිබඳ අවිනිශ්චිතතාවයක් පැවතීම හේතුවෙන් ශ්‍රී ලංකාව ගොඩනැගීමේ ප්‍රදර්ශන වෙනුවෙන් ලද සියළු තථ්‍ය ආදායම් ගිණුම් ගත කිරීමේ ක්‍රියාවලියක් පැවතුනි. කෙසේ වෙතත්, අපි මෙය නිවැරදි කර LKAS 1 හි විධිවිධාන අනුගමනය කරමු. | මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී උපචිත ගිණුම්කරණය සංකල්පය භාවිතා කළ යුතුය. |
| (ආ) වෘත්තීය මධ්‍යස්ථානයක් පිහිටුවීම සඳහා ඉඩමක් වෙන් කර ගැනීම වෙනුවෙන් නාගරික සංවර්ධන අධිකාරියට ගෙවන ලද රු.500,000 ක සැකසුම් ගාස්තුව, ආපසු ගෙවිය හැකි තැන්පතුවක් ලෙස සලකා දේපළ, පිරියත සහ උපකරණ යටතේ ගිණුම් ගත කර තිබුනි. එසේ වුවද මෙම මුදල ආපසු ලැබිය යුතුයැයි සැළකීමට කිසිදු සාක්ෂියක් නොතිබුනි. එබැවින්, සමාලෝචිත කාල පරිච්ඡේදයේ ඌනතාවය සහ 2019 දෙසැම්බර් 31 දිනට විට දේපල, පිරියත සහ | මණ්ඩලයට තමන්ගේම කාර්යාල ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා වසර 30 ක බදු පදනමින් ඉඩමක් ලබා ගැනීම සඳහා සැකසුම් ගාස්තුවක් ලෙස රු.500,000 ක මුදලක් තැන්පත් කරන ලෙස නාගරික සංවර්ධන අධිකාරිය විසින් අපගෙන් ඉල්ලීම් කර තිබුනි. එපරිදි එම මුදල දේපල, පිරියත සහ උපකරණ යටතේ ගිණුම් ගත කරන ලදී. ඊළඟ වර්ෂයේදී අපි එය වියදමක් | වත්කම් හා වියදම් අයිතමය වෙන වෙනම හඳුනා ගැනීමට පියවර ගත යුතු. |

| | | |
|---|---|---|
| උපකරණ සමාන ප්‍රමාණයකින් පිළිවෙලින් අඩුවෙන් හා වැඩියෙන් දක්වා තිබුනි. | ලෙස අය කර ගන්නෙමු. | |
| (ඇ) වැඩියෙන් ලැබී තිබූ රු. 74,409 ක සාමාජික මුදල් සහ අත්තිකාරම් වශයෙන් ලැබී තිබූ රු.24,227,663 ක ශ්‍රී ලංකාව ගොඩ නැගීමේ ප්‍රදර්ශණ ආදායම් වෙන් වෙන්ව ගිණුම්ගත කිරීම වෙනුවට වෙළඳ ණය ගැතියන් ලෙස ගිණුම් ගත කර තිබුනි. මේ හේතුවෙන්, 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දක්වා තිබූ වෙළඳ හා වෙනත් ලැබිය යුතු දේ රු.7,114,258 ක ඍන අගයක් ගෙන තිබුනි. | මින් පසු එවැනි ගෙවීම් නිවැරදි ගිණුම් වල සටහන් කිරීමට කටයුතු කරනු ලැබේ. | මෙම ආකාරයේ මූලික ගිණුම්කරණ දෝෂ අවම කිරීම සඳහා පියවර ගත යුතුයි. |

## 1.6 සම්බන්ධිත පාර්ශවයන් හා සම්බන්ධිත පාර්ශව ගනුදෙනු හෙළිදරව් නොකිරීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2018 නොවැම්බර් 15 සිට 2027 දෙසැම්බර් 31 දක්වා කාලයක් සඳහා වන වසර 09 ක බදු කුලිය වූ රු.15,000,000 ක සම්පූර්ණ මුදලම අත්තිකාරම් වශයෙන් ගෙවා කාර්යාල පරිශ්‍රයක් බදු පදනමින් ලබා ගැනීම වෙනුවෙන් මණ්ඩලය සහ පෞද්ගලික සමාගම අතර 2019 අගෝස්තු 02 දින බදු ගිවිසුමකට එළඹී තිබුනි. කෙසේ වෙතත්, ඉහත සඳහන් පෞද්ගලික සමාගමේ අධ්‍යක්ෂවරයා මණ්ඩලයේ සභාපතිවරයා ලෙසද කටයුතු කරන බව නිරීක්ෂණය විය. | අදහස් දැක්වීම් කර නොතිබුනි. | සම්බන්ධිත පාර්ශවයන් හා සම්බන්ධිත පාර්ශව ගනුදෙනු හෙළිදරව් කිරීමට කටයුතු කළ යුතුයි. |

## 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 2017 අංක 24 දරණ දේශීය ආදායම් පනත සහ දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ අංක SEC/2018/06 දරණ හා 2018 අප්‍රෙල් 18 දිනැති චක්‍රලේඛය. | සන්කන් කන්ස්ට්‍රක්ෂන් (පුද්ගලික) සමාගම වෙත ගෙවා තිබූ රු.15,000,000 ක ගොඩනැගිලි කුලී මත රු. 1,500,000 ක රඳවා ගැනීම් බද්ද (WHT)අයකර දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර නොතිබුනි. | මෙය අතපසු වීමක් වන අතර මෙම ගෙවීම් 2018 නොවැම්බර් මාසයේදී සිදුකර තිබූ හෙයින් මෙය 2018/2019 මූල්‍ය වර්ෂයට අයත් වේ. අප මෙම බදු අඩු කර රඳවා ගැනීම් සහතිකයක් ලබා නොදීම හේතුවෙන් සැන්කන් කන්ස්ට්‍රක්ෂන් (පුද්) සමාගම කිසිදු රඳවා ගැනීම් බද්දක් අඩු | දේශීය ආදායම් පනතේ විධිවිධානවලට අනුකූලව කටයුතු කිරීමට මණ්ඩලය පියවර ගත යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | | නොකර ඔවුන්ගේ බදු ගෙවා ඇත. | |
| (ආ) | 2019 අංක 23 දරණ ශ්‍රී ලංකා ඉදිකිරීම් කර්මාන්ත මණ්ඩලයේ (සංසථාපිත) පනතේ 12 වගන්තිය. | මේ පණත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුවම වූ දිනයේදී මණ්ඩලය විසින් ගෙවිය යුතුව තිබූ සියළු ණය සහ බැරකම් මෙහි සංස්ථාපනය කරනු ලබන සංස්ථාපිත මණ්ඩලය විසින් ගෙවිය යුතු අතර, එදිනට මණ්ඩලයට අයවිය යුතුව තිබූ සියළු ණය සහ මණ්ඩලයට ගෙවිය යුතු සියළු දායක මුදල් මේ පණතේ කාර්ය සඳහා සංස්ථාපිත මණ්ඩලය වෙත ගෙවනු ලැබිය යුතුය. වෙළඳ හා වෙනත් ලැබිය යුතුය. කෙසේ වෙතත් ගිණුම්කරණ කාලසීමාව ආරම්භයේදී රු.2,641,767 ක වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු දේ සහ රු.6,304,866 ක ජංගම හා ජංගම නොවන වගකීම් තිබුනද මණ්ඩලය මෙම අවශ්‍යතාවයන්ට අනුකූල වී නොතිබුනි. | ව්‍යාපාර කටයුතු අඛණ්ඩව අඛණ්ඩව පවත්වාගෙන යන බැවින් වාර්තාවේ නිරීක්ෂණය අනුව අපි කටයුතු කර නොමැති අතර සිදු වී ඇති එකම වෙනසක් වන්නේ නව ආයතනය වෙත වත්කම් හා වගකීම් නව ආයතනයට අවශෝෂණය කර ගැනීමය. තවද කළමණාකරණ මණ්ඩලයේද කිසිදු වෙනසක් සිදුවී නොමැත. | පණතේ විධිවිධාන වලට මණ්ඩලය අනුකූල විය යුතුයි. |

## 2. ගිණුම් කටයුතු භාවය සහ යහපාලනය

### 2.1 සංයුක්ත සැලැස්ම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කළමනාකරණය විසින් ආයතනයේ ඉලක්කයන් හා අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා උපාය මාර්ග හඳුනා ගනිමින් සංයුක්ත සැලැස්මක් පිළියෙල කර නොතිබුනි. | අදහස් දැක්වීම් කර නොතිබුනි. | ව්‍යවසායයේ අනාගත මහ පෙන්වීම් සඳහා වන උපාය මාර්ග ඇතුළත් කරමින් වසර තුනකට නොඅඩු කාලයක් සඳහා සංයුක්ත සැලැස්මක් සකස් කළ යුතුය. |

### 2.2 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මණ්ඩලය විසින් ඉලක්ක නිශ්චය කරමින් සහ නිලධාරීන් වෙත වගකීම් පවරමින් එම ඉලක්ක අදාල කාල සීමාව තුළ සාක්ෂාත් කර ගැනීම සඳහා | අදහස් දැක්වීම් කර නොතිබුනි. | ඉලක්ක නිශ්චය කර අදාළ නිලධාරීන්ට වගකීම් සහ කාල නියමයක් පවරා සංයුක්ත සැලැස්මට අනුකූලව වාර්ෂික |

| | | |
|---|---|---|
| වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර නොතිබුණි. | | ක්‍රියාකාරී සැලැස්මක් සකස් කළ යුතුය. |

**3.** **අයවැය පාලනය**

-------------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ආදායම් හා වියදම් අයිතම හතරකට අදාල අයවැයගත සහ තථ්‍ය සංඛ්‍යා අතර සියයට 46 සිට සියයට 518 දක්වා වූ පරාසයක සැලකිය යුතු විචල්‍යතාවයන් නිරීක්ෂණය වූ බැවින්, අයවැය කළමනාකරණ පාලනයෙහි ඵලදායී කාරකයක් ලෙස යොදාගෙන නොතිබූ බව අනාවරණය වී තිබුණි. විස්තර පහත පරිදි විය. | අදහස් දැක්වීම් කර නොතිබුනි. | කළමනාකරණ පාලනය සඳහා ඵලදායී කාරකයක් ලෙස අයවැය භාවිතා කිරීමට කළමනාකරණය නිසි පියවර ගත යුතුය. |

| | 2019 තථ්‍ය | 2019 අයවැයගත | වෙනස | |
|---|---|---|---|---|
| | රු. | රු. | රු. | (% ) |
| ආදායම | 28,911,694 | 19,677,872 | 9,233,822 | 46 |
| සෘජු පිරිවැය | 18,250,424 | 6,779,996 | 11,470,428 | 169 |
| අනෙකුත් ආදායම් | 3,633,803 | - | 3,633,803 | 363 |
| මූල්‍ය පිරිවැය | 27,824 | 4,500 | 23,324 | 518 |